# අම්පාර දිස්ත්‍රික්කයේ වැම්පිටිය ප්‍රදේශයෙන් හඳුනාගත් නව මූල ඓතිහාසික සුසාන භූමිය පිළිබඳ ව මූලික අධ්‍යයනයක්

ආර්.ඒ. බුද්ධික ධනංජය රණසිංහ[4]

ප්‍රාග් ඓතිහාසික යුගයත් ඓතිහාසික යුගයත් අතර සංක්‍රාන්තික අවධියේ සාධක සපයන ප්‍රමුඛ මූලාශ්‍රයක් ලෙස මූල ඓතිහාසික සුසාන භූමි හඳුන්වාදිය හැකි ය. ගල් යුගයෙන් පසු ස්ථිර ජනාවාස පිහිටුවා ගෙන කුඩා වාරි කර්මාන්ත ආරම්භ කර මැටි බඳුන් භාවිත කරමින් කෘෂි බිම් ජනාවාස අවට බීහිකරගනිමින් සරල ජීවන අවශ්‍යතා සපුරා ගත් බවට සාධක මූල ඓතිහාසික සුසාන භූමි වලින් හමු වේ. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ අහඹු ගවේෂණයකින් හමු වූ මෙම සුසාන භූමිය අනාවරණය කිරීම සහ ඒ තුළින් අම්පාර දිස්ත්‍රික්කයේ ජනාවාසකරණය පිළිබද ඓතිහාසිකත්වය අනාවරණය කිරීම ය. මේ සඳහා අනුගමනය කළ ක්‍රමවේද අතර ක්ෂේත්‍රගත ව සුසාන භූමිය ඡායාරූප ගත කිරීම සහ මෙතෙක් මූල ඓතිහාසික සුසාන භූමිවල සිදුකර ඇති පර්යේෂණ අධ්‍යයනය කර ඒ පර්යේෂණ ආශ්‍රය කරගනිමින් වීරන්තලාව මූල ඓතිහාසික සුසාන සංකීර්ණය ආශ්‍රිත ව සිදු වූ ජනාවාසකරණය අධ්‍යයනය කිරීම මූලික වේ. මෙම ගවේෂණයෙන් හමු වූ මැටි බඳුන් කැබලි ස්වල්පය අධ්‍යයනයට මූලික ව යොදා ගන්නා ලදි. පර්යේෂණයට බඳුන් වූ සුසාන සංකීර්ණය අම්පාර දිස්ත්‍රික්කයේ මහඔය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් වැම්පිටිය ගමේ සිට සැතපුම් 1 පමණ නැගෙනහිර දෙසින් පිහිටා තිබේ.

ප්‍රමුඛ පද: වීරන්තලාව, මූල ඓතිහාසික ජනාවාසකරණය

[4] පුරාවිද්‍යා අධ්‍යයනාංශය, කැළණිය විශ්වවිද්‍යාලය.